# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

# නවීන තාක්ෂණයන් පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

# ඇබෑර්තු

# (වසරක කොන්ත්‍රාත් පදනම මත)

නවීන තාක්ෂණයන් පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) යනු දැනට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පර්යේෂණ හා සංවර්ධන, පුහුණු සහ තාක්ෂණ හුවමාරුව මගින් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය, රොබෝ විද්‍යාව සහ අභ්‍යවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රවල නවීන තාක්ෂණයන් රටට හඳුන්වා දීම වේගවත් කිරීම මෙම ආයතනයට පැවරී ඇති බලතල වේ.

පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍ය සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ආයතනය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් සියලුම ප්‍රතිලාභ සඳහා, කරුණාකර නවීන තාක්ෂණයන් පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න: **www.accimt.ac.lk**

**පහත සඳහන් තනතුරු HM 2-2 වැටුප් කේතය යටතට වැටේ**

1. මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (RS සහ GIS පිළිබඳ විශේෂඥතාව සහිත අභ්‍යවකාශ තාක්ෂණය සහ යෙදවුම් විෂය ක්ෂේත්‍රය සඳහා)
2. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික මෙහෙයුම්) තනතුර
3. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) තනතුර

   සියලු දීමනා ඇතුළත් මාසික කොන්ත්‍රාත් දීමනාව: රු. 142,410.00 + (රු. 17,800.00 ජීවන වියදම් දීමනාව) = රු. 160,210.00

   **වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**පහත සඳහන් තනතුරු MM 1-1 වැටුප් කේතය යටතට වැටේ**

4. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර
5. සහකාර අධ්‍යක්ෂ (පුස්තකාල සේවා) තනතුර
6. සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර
7. සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර

**සියලු දීමනා ඇතුළත් මාසික කොන්ත්‍රාත් දීමනාව :**

රු. 81,710.00 + (රු. 17,800.00 ජීවන වියදම් දීමනාව) = රු. 99,510.00

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

8. පද්ධති විශ්ලේෂක තනතුර (AR 1 වැටුප් කේතය)

   සියලු දීමනා ඇතුළත් මාසික කොන්ත්‍රාත් දීමනාව: රු. 81,675.00 + (රු. 17,800.00 ජීවන වියදම් දීමනාව) = රු. 99,475.00

   **වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

9. සහකාර නඩත්තු ඉංජිනේරු තනතුර (JM 1-2 වැටුප් කේතය)

   සියලු දීමනා ඇතුළත් මාසික කොන්ත්‍රාත් දීමනාව: රු. 66,781.00 + (රු. 17,800.00 ජීවන වියදම් දීමනාව) = රු. 84,581.00

   **වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ :**

1. සේවක අර්ථ සාධක අරමුදල (EPF) සේවක 10%, ACCIMT 15%
2. සේවක භාරකාර අරමුදල (ETF) ACCIMT 3%

**සාමාන්‍ය කොන්දේසි**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ කර්තව්‍යයන් මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**අවසාන දිනය : 2026/09/28**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සහ සහතිකවල අදාළ පිටපත් සහිත අයදුම්පත් අවසාන දිනයට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත භාවිත කරන්න. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්පතෙහි පූර්ව පිටපතක් (advance copy) සඝුවම යැවිය හැක. ඉල්ලුම් කරන තනතුර කවරයේ ඉහළ වම් පස කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සටහන :** අයදුම්පත් අපගේ ආදර්ශ අයදුම්පත් ආකෘතිය භාවිතයෙන් එවිය යුතුය. ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* ඉහත කුමන හෝ තනතුරක් සඳහා අභ්‍යන්තර අයදුම්කරුවකු තෝරාගන්නේ නම් ස්ථිර කාණ්ඩයේ සේවකයින්ගේ උසස්වීමක් ලෙස සලකණු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී,**
**නවීන තාක්ෂණයන් පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය, කටුබැද්ද, මොරටුව.**
**දුරකථන: +94(0)11 2650838 / +94(0)11 2650569**